# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1647/8 - 2010 මාර්තු 31 වැනි බදාදා - 2010.03.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 94/47 II.

**(269 වන අධිකාරය වූ ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනත**

6 (2) (ආ) සහ 21 (2) (ආ) වගන්තිය යටතේ වූ නියමය

(269 වන අධිකාරය වූ ) නගර හා ග්‍රාම නිර්මාණ ආඥාපනතේ 6 (2) (ආ) වගන්තිය සහ 21(2) (ආ) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මා විසින්, මේ නියමය මගින්-

(අ) ඉහත කී ආඥාපනතේ කාර්ය සඳහා මෙහි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඉඩම් ප්‍රදේශය නාගරික සංවර්ධන ප්‍රදේශයක් බවටත් එය “ අම්බලන්තොට ගිරිහඬු මහා විහාර පූජා භූමිය ” යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු බවටත් ප්‍රකාශයට පත් කරනු ලැබේ ; සහ

(ආ) අම්බලන්තොට ගිරිහඬු මහා විහාර පූජා භූමිය වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබූ සම්පූර්ණ ප්‍රදේශය සම්බන්ධයෙන් පරිබාහිර ක්‍රමයක් සකස් කළ යුතු බවට විධාන කරනු ලැබේ.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2010 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

*උපලේඛනය*

***අම්බලන්තොට ගිරිහඬු මහා විහාර පූජා භූමිය සංයුක්ත වන ප්‍රදේශය***

දකුණු පළාතේ, හම්බන්තොට දිස්ත්‍රික්කයේ, අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නැගෙනහිර ගිරුවාපත්තුවේ, තුවාළුවිල ග්‍රාමසේවා වසමේ, තුවාළුවිලගමේ අ.ග.පි. 466 හි කැබලි අංක 617 ලෙස හඳුන්වන ගිරිහඬු පුරාණ රජමහා විහාරය නැමැති මුළු බිම් ප්‍රමාණයෙන් හෙක්ටයාර් 2.1032 ක් වූ විශාලත්වයෙන් යුතු පහත දැක්වෙන පරිදි මායිම් වූ මුළු භූමි ප්‍රදේශය :-

| | | |
|---|---|---|
| *උතුරට* | : | අ.ග.පි. 466 - තුවාළුවිල ගමේ කැබලි අංක $143^{C}$, 141, $143^{C}$, 141 සහ වළවේ ගඟ ද ; |
| *නැගෙනහිරට* | : | වළවේ ගඟ ද; |
| *දකුණට* | : | අ.ග.පි. 466 - තුවාළුවිල ගමේ කැබලි අංක $141^{A}$ සහ $139^{A}$ ද ; |
| *බටහිරට* | : | අ.ග.පි. 466 - තුවාළුවිල ගමේ කැබලි අංක $139^{A}$ , ප්‍රාදේශීය සභා මාර්ගය, අ.ග.පි. 466 තුවාළුවිල ගමේ කැබලි අංක $143^{C}$, 141, $143^{C}$ හා 141 ද වේ. |

04-393

1A - G 12673— 380 (2010/03) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.